පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සති පාසල

විෂය:- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය :

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

(1) හවුල් ව්‍යාපාරයක පැවැත්ම බෙහෙවින් තහවුරු කර ගත හැක්කේ,

(1) හවුල්කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක වීමෙනි.
(2) සියළුම හවුල්කරුවන් කළමණාකරණයට සක්‍රීය ලෙස සහභාගී වීමෙන්
(3) ලිඛිත ගිවිසුමක් ඇති ව පවත්වාගෙන යාමෙනි.
(4) හවුල් ව්‍යාපාරයක ලියාපදිංචි කිරීමෙනි.

(2) වෘත්තීය ව්‍යාපාර සඳහා වැඩි වශයෙන් යොදාගන්නා සංවිධාන ක්‍රමය වනුයේ,

(1) තනි ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර
(3) සීමිත පෞද්ගලික සමාගම් (4) ජනතා සමාගම්

(3) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) හවුල්කරුවන් සාමූහික වශයෙන් වගකීමට බැඳේ.
(2) හවුල්කරුගේ වගකීම බාහිර කෙනෙකුට පැවරිය හැක.
(3) හවුල්කරුගේ වගකීම අනිකුත් හවුල්කරුවන්ට පැවරිය හැක.
(4) හවුල්කරුවන් සාමූහිකව වගකීමට බැඳී නැත.

(4) පහත සඳහන් ප්‍රකාශවලින් හවුල් ව්‍යාපාරයක් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ලියාපදිංචිය අනිවාර්ය වීම.
(2) හවුල්කරුවන් විසින් ම කළමනාකරණය කළ යුතු වීම.
(3) ආරම්භ කිරීම සඳහා ලිඛිත ගිවිසුමක් තිබිය යුතු වීම.
(4) වගකීම සීමාරහිත වීම.

(5) අමා සහ පබා රෙදිපිළි ව්‍යාපාරයේ නව කර්මාන්තශාලාව ඉදිකිරීමට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීම සඳහා යොදා ගත හැකි මූල්‍ය සම්පාදන මාර්ගය කුමක් ද?

(1) සාමාන්‍ය කොටස් නිකුත් කිරීම. (2) වරණීය කොටස් නිකුත් කිරීම.
(3) ණයකර නිකුත් කිරීම. (4) බැංකු ණය ලබා ගැනීම.